## ක්ෂුද්‍ර මූල්‍ය බැංකුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව - බලංගොඩ පුහුණු මධ්‍යස්ථානය

සමෘද්ධි බැංකු හා සමෘද්ධි මහා සංගම් වල කළමණාකරුවන්ට හා කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා බලංගොඩ පුහුණු මධ්‍යස්ථාන විසින් සංවිධානය කර ඇති ක්ෂුද්‍ර මූල්‍ය බැංකුකරණය පුහුණු පාඨමාලාව 2012.07.04, 05 හා 06 යන දිනයන්හිදී බලංගොඩ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබින. ඒ සඳහා ගාල්ල, හම්බන්තොට, මාතර, කළුතර, මොණරාගල හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල නිලධාරීන් සහභාගි වූහ. මෙම වැඩසටහන සඳහා සම්පත්දායකයින් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ හා බැංකු ක්ෂේත්‍රයේ විශේෂඥවරුන් ගේ සහය ලබා ගන්නා ලදි.

මෙම පුහුණු වැඩ සටහන සමෘද්ධි බැංකු හා මහා සංගම් හි සියළුම කාර්යය මණ්ඩල නිලධාරීන් සඳහා ලබා දීමට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය තීරණය කොට ඇත. මෙම වැඩසටහන මෙහෙයවීම මානව සම්පත් අංශය මගින් කරනු ලබන අතර, නිල්ලඹ හා බලංගොඩ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන සඳහා ක්‍රියාත්මක කෙරෙනු ඇත.

මෙම වැඩසටහනට සහභාගි වීම සඳහා අදාල නිලධාරීන් හට ඉහත පුහුණු මධ්‍යස්ථාන වෙත අයදුම් කිරීමෙන් අවස්ථාව ලබා ගත හැක.

- නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය - 081 -3801889
- බලංගොඩ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය - 045 -3455495
- මානව සම්පත් අංශය - 011 -2873794

මානව සම්පත් අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් පුහුණු වැඩසටහන් පිළිබඳව දැනගැනීම සඳහා සමෘද්ධි පුහුණු අත්වැල කෘතියට පිවිසෙන්න. එමෙන්ම මානව සම්පත් අංශය මගින් නිකුත් කර ඇති පුහුණු චක්‍රලේඛණ පිරික්සීමෙන් තොරතුරු ලබා ගත හැක.